

# වම් ඉවුරේ මිනිස්සු

### රාජාංගනේ මතක සටහන්

## බොට මාබෝවේ පිහිටයි. අපේ රාල බොට කියනකොටම ලිප ගිනිලාපං මයෙ අප්පා...

විගැහින් නැගිට.... ඇට් කුබ්බා බුඃ ගැහැව්වා.. වතුර ඩිංගකින් කට පිහදාන මේ ඉරමුසු වතුර ඩිංග බී

දනි පනි ගා නැගිටගත් මම කට සෝදාගෙන ඉරමුසු පැන් බොන ගමන් කොයින් මාමා ලකලැහැස්ති වන තැනට ළං වුණෙමි..

වතුර ඩිංගකින් මූණ පිහදා ගං.. ඒ මදෑ.. දෙහි උලල දිය නාගන්ට තියෙනවා වැවෙන්.. පස්සෙන් පහු මේ පිරුවට මං ඇඟ පටලන්නං..

කඩිමුඩියේ ඔවුන් සමග ගෙයින් එළියට බහිනකොට හතරවටින් පන්දම් දල්වගෙන හේන් ඉම එකාලා වෑ කණ්ඩියට යන්ට එනවා.

ඉක්මන් කර ගමං ගස්සපියව්.. මුඩු මහණගෙ ලෙනට ඉහත්තාවෙන් ඉර මාන බලන්ට කලින් ඉතුරුම් මුට්ටියට ලිප ගිණිලන්ට ඕනෑ.. කියමින් කොයින් මාමා පෙරමුණ ගත්තේ ය. වෑ ඉස්මත්තට ළගාවන විට හේන් ඉම එකාලා සේරම පොදි ගැහිලා එතන.

මොකෑ කොයින් මාමා පිරිමි එකාලා විතරක්..?

අඩා දේව කාරිය අහවර වත තුරු ඉස්තිරි පරාන වලට මෙහෙ ඉන්න තහනම්.. උන් එන්නෙ අන්නවිරාල හක තුන් විට අඬ කෙරුවායින් පහු.. අඩා මුත්තප්පා.. මේ මහතැන් එක්ක වැවට ගොහින් ඉහදිය වක්කරාන වර.. මං මල්පැල ළඟට ගොහින් හරි කර ගන්නං..

හිසේ දෙහි තවරාගෙන වැවෙන් දිය නා ගත් මම මුත්තප්පා සමග මල් පැල ළඟට ආවෙමි. ගම්මුන් රාත්‍රියේ මෙහි සිට කුඩා දේවාලයක් ගොක් කොළ වලින් තනා දේව පූජාව සඳහා ඉතා ලස්සනට සරසා ඇත . මල් පැල ඉදිරියේ කිරි පුරවන ලද මුට්ටියක් ලිපක් සාදා ඒ මත තබා ඇත. කොයින් මාමා විගැහින් මට සුදු සරමක් අන්දවා ජටාවක් හිස බැඳ බොහොම භක්තියෙන් කපුවා ලවා යමක් කියවා ලිප ළඟට එක්කරගෙනවිත් මගේ දකුණු අතට දල්වන ලද පන්දමක් දී කපුවා කියන විට ලිප ගිනි දල්වන මෙන් පැවසුවේ මෙලෙසයි.

බොට මාබෝවේ පිහිටයි. අපේ රාල බොට කියනකොටම ලිප ගිනිලාපං මයෙ අප්පා...

උන්දෑ මගේ හිස අතගා පැවසුවේ මහා රාජකාරියක් තම දරුවකු ලවා කරවන්නට ලැබීමේ සතුටක් ලබන පියෙක් මෙනි.

අන්නවිරාලගේ නියමයෙන් මම ලිප ගිනිලෑවා. හැම එකාලම පොර කනවා කිරි ඉතිරෙන පැත්ත බලන්න. කොයින් මාමා මුඩුමහනගෙ ලෙනට උඩින් ඉර එබෙනකම් බලා ඉන්නවා. ගිනි සැර වැඩි වී කිරි මුට්ටිය පැසී ඉතිරෙන්නට විය.

ආං බලව් ඉර මහනගෙ ලෙනට උඩින්.. කොයින් මාමා කියනකොටම මුත්තප්පා සතුටින් කෑගැසුවේ මෙලෙස..

බොලා කොයින් රාලේ.. මේං බල .. අපේ ආතා මුත්තා කාලෙවත් කොයිබ ඉතුරුම නැගිහිරුට ගියේ.. අද නැගිහිරට නොවැ දෝරෙ ගැලුවේ.. අඩා මලයා.. උඹව සීවරං දේයියෝ රකිනවා.. කියමින් මුත්තප්පා මාමා මා ඔසවාගෙන ගොස් වෑ කණ්ඩියේ පන් පැදුර මත තැබුවේ කුඩා දරුවකු තබන්නාක් මෙන් ය. ඉන්පසු ඔවුන් දේවකාරියේ ඉතිරිය කරනු මා බලා සිටියේ අපමණ සතුටකිනි.

විශාල කිරිබතක් පිසින අතර අනෙක් අය දහවල් කෑම සූදානම් කරන්නට විය. එහි විශේෂත්වය වූයේ සියල්ල මස් මාංශයෙන් තොරවීම සහ සියලු ඉහුම් පිහුම් කටයුතු පිරිමි අය අතින් සිදුවීමයි. මා බලා සටින්නේ මේ හැම අතරින්ම මලී එනතුරු ය. අන්නවි රාල බොහොම භක්තියෙන් දේව දානය සියලු දෙනාගේම සාදුකාරය මැද මල්පැලෙහි තැන්පත් කර කී කවිය මා සිත තවමත් දෝංකාර දෙයි.

*වලු මල් ගෙන බන්දා කොකුන් පිණි දියයෙන ඉසිමින්දා*
*වනමල් බුලතින්දා සියලු සුවඳින් නිති විල සින්දා*
*දෙවිඳුට පුද දුන්නා සියලු ජනපත නිය මුල සින්දා*
*සැමකල් රැකෙන්දා වඩින් සිව් දෙවියන් අනයෙන්දා*

මේ පද පේලිය දිගේලි කළ අන්නවිරාල හක් ගෙඩිය ගෙන තෙවරක් හඬ නැගීය. මොහොතින් ගැහැණු උදවිය වෑ කණ්ඩිය මතට පැමිණියේ ඔවුන් ගෙවලදී පොදි බැඳගත් සියලු රස කැවිලිද සමගින් ය.

මලිත්ති මා අසළට පැමිණියේ මුව පුරා සිනාසෙමින් ය. ඇය අත වූයේ දෙවොලට පූජා කිරීමට ගෙනා නෙලුම් මල් මිටියකි.

බෝගල

ඇය ශ්‍රී ලංකාවේ උතුරු මැද පළාතේ රෝහලක සේවය කරන තරුණ වෛද්‍යවරියකි....
මේ ඇගේ සායනික සටහන් නොවේ...
ජීවන සටහන් ය...




"ඩොක්ටර්ට මතකද මාව ?" ඇය මගෙන් ඇසුවාය.

"කී දෙනෙක් මතක තියා ගන්නද ?" මට සිතිනි.

"මේ ඩොක්ටර් තමයි මගේ වැදෑමහ එළියට අරගෙන මාව බේර ගත්තේ..." ඇය ඇගේ ස්වාමි පුරුෂයාට එකවනම පැවසීය, ඒත් මහ හයියෙනි, ඒ හරෑට හෙදියද බෙල්ල උස්සා අප දෙස බැලීය .

ඇය පැවසූ ඒ සිදුවීම මට මතක් විනි. එදින අපේ අපේ විශේෂඥ වෛද්‍යවරයා නොමැති නිසා සීසේරියන් සැත්කම් හෝ මොනම හදිසි සැත්කමක්වත් කරන්නට නොහැකි නිසා සියලූම එවැනි හදිසි අවස්ථා කලින් හඳුනාගෙන ඊළඟ මහ රෝහල වෙත යවන ලද සති අන්තයක් විය.

නොහැකි ලෙස එය කෑලි කැඩී ගොස් තිබිනි.

"අම්මේ හම්බුනේ දුවෙක්ද පුතෙක්ද, කීවෙනි දරුවාද ? ගෙදර ඉන්න දරුවන්ගේ වයස කීයද ?"

"අප්පේ ගෙදර ඉන්නේ අයියලා දෙන්නෙක්ද එහෙනම් මේ නංගි බබාට ගැලවිල්ලක් නැති වෙයි" මම ඇගේ අවධානය වෙනතකට යොමු කරන අතරේ ටිකෙන් ටික කොටසින් කොටස එළියට ගත්තෙමි. අවසන එක කෑල්ලක්වත් නොතිබෙන බවට සනාථ කරගන්න තෙක් සියල්ල අවසන් කල පසු රුධිර වහනයද නැවතිනි.

අම්මාව මීට එහා මහ රෝහලට යැවීමට හෝ සැත්කමට භාජනය කිරීමට අවශ්‍ය වුනේ නැත. අම්මා දැඩි වෙහෙසින් සහ කැක්කුම් වේදනා නිසා මහන්සිය පත්වී සිටියාය. ජීවිත හා මරණය අතර පොර බදන අපිට මෙවැනි අත්දැකීම් ඕනෑ තරම් වේ.

# අනේ මම මැරෙයිද නෝනා.?



ඒ මව දරු ප්‍රසූතියෙන් පසු වැදෑමහ ගර්භාෂයෙන් එළියට පැමිණියේ නැති නිසාත්, බොහෝ සේ රුධිරය වහනය වෙමින් තිබුන නිසාත් අප විශේෂඥ වෛද්‍යතුමන් මෙහි නොසිටීම නිසාත්, ඍඍජක ඉක්මනින් සැත්කමකට භාජනය කළ යුතු වූයෙන් , මීට එහා පිහිටි මහ රෝහලට යැවිය යුතු විනි. වේලාව රාත්‍රී 12යි. අනෙක් වෛද්‍යවරයා විසින් කිහිප වරක් උත්සහ කළද එය එළියටගැනීමට නොහැකි විය. පසුව මට කතා කළේය.

"අනේ වඳින්නම් මාව වෙන තැනකට යවන්න එපා. ඉක්මනින් මට මගේ දරුවා බලන්න ඉඩ දෙන්න" අම්මා ප්‍රසූතිකාගාරයේ ඇඳෙන් බිමට පැනීමට සැරසේ.

"මේ අම්මා මෙහෙම යැව්වොත් ගොඩක් බ්ලීඩ් වෙන්න ඉඩ තියෙනවා, අපි කොහොම හරි එළියට ගමු"

හුගක් වෙහෙසවී සිටි අනෙක් වෛද්‍යවරයා ෆෝම් පුරවන අතරේ... නැවත අවශ්‍ය ඖෂධ කැක්කුම් නාශක එන්නත් දෙමින්, හේදිය විසින් කපන ලද අත් වැසුම් එකින් එක මම වැලමිට දක්වා දමා ගත්තෙමි. වැදෑමහ සිරවූ විට, ඇඟිලි කපන ලද පිරිසිදු අත්වැසුම් වැලමිටට එහා සිට එකිනෙක දමා ගත යුතුය.අන්තිමට ඇඟිලි සහිත අත් වැසුම් දමන විට මුලූ අතම රබර් ගලවුස් නිසා තදවී ඇදුම් කයි. එහෙත් අපේ කාර්යය අප කළ යුතුය.

"අනේ මම මැරෙයිද නෝනා... අනේ කැක්කුමයි නෝනා.." අම්මා වැලපේ.

"හරි අම්මේ හොඳට හුස්ම ගන්න, කලබල වෙන්න එපා, තද කරන්නේ නැතුව මට උදව් වෙන්න" වැදෑමහ සම්පූර්ණ වශයෙන් එළියට ගැනීමට

අපි ඇය වෙත කිරි දෙන්න යැයි ඉක්මනින් දරුවා ලබා දුන්නෙමු. අම්මා ප්‍රසූත කාමරයෙන් ට්‍රොලිය මත සිට එළියට යද්දී මා වෙත බලා දෑත් එකතු කළාය. යළි පිටව යන තුරු... අප ඇයව මේ රෝහලින් එහා නොයවා බේරා ගැනීම ගැන ස්තූතියි කළාය.

දැන් ඒ අම්මා මා ඉදිරියේ සිටී. අපට සැනසෙන්න මේ ටිකම ඇති නොවේ ද ?

සැත්කම් කරද්දී බොහෝ විට ඉදිකටු අතේ ඇනෙයි. සමහර විට රුධිර නාලිකා පිපිරීම හෝ බොහෝ විට පෙකණිවැල කපද්දී රුධිරය දස අත විදිමින් විසිරේ.. අපේ නිරාවණය වූ මුහුණේ කොටසේ , ඇස්.. වල තැවරේ. මාතෘ හා ගැබිණි වාට්ටුවල සෑම අම්මෙක්ටම ඩෘසෘබ පරීක්ෂණය කර නොතිබිනි. හදිසි අවස්ථාවක කිසිවක් පරීක්ෂා නොකෙරේ. ඔවුන්ගේ රුධිරය අප කැපුම් තුවාල ඔස්සේ අප ශරීර ගත වේ. ඒඩ්ස් තිබෙනවාදැයි වත් නොද නී.

සීමාවාසික කාලය පටන් ගත් මුලදී නම් කැපුමක් මසද්දී අතේ ඉදිකටුවක් නො ඇනුනු දිනක් නොවීය. දිනක් සීසේරියන් සැත්කමක් අවසානයේ අත් වැසුම් ගලවද්දී මා දුටුවේ ඉදිකටු පාරක් ඇනී ඇති අන්දම. ඉතා දුක්බරව..

"අපොයි අම්මාට භයානක ලෙඩ නොවේවායි ප්‍රාර්ථනා කරනවා" යි මම කියද්දී , නිර්වින්දක වෛද්‍යවරයා මා වෙත එමින් පැවසුවේ. රුධිර නාලිකාවට කැනියුලාව ඇතුල් කිරීමටයද්දී ඒ අම්මා දැගලූ නිසා කටුව ඔහුගේ ඇඟිල්ලේ ඇනුනු බවයි.

"මගෙත් ඇනුනා, හැදුනොත් අපි දෙන්නටම ..." ඔහු හිනාවෙමින් පැවසුවේය

www.sammasa.net / www.sannasa.com